# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 2171635<br>10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011- |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1717/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 15/11/2024<br>පැය 0540 |


## මාධ්‍ය නිවේදනය

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු**

**01. මනුෂ්‍ය ඝාතනයක් - ගාල්ල පොලිස් වසම.**

2024.11.15 වන දින අළුයම් කාලයේදී ගාල්ල පොලිස් වසමේ දඩැල්ල ප්‍රදේශයේ නිවසකට මුහුණු වසාගෙන පැමිණි පුද්ගලයෙකු තියුණු ආයුධයකින් නිවැසියන්ට සිදුකළ පහරදීමකින් අඹු සැමි යුවලක් සහ ඔවුන්ගේ දියණිය තුවාල කරාපිටිය රෝහලට ඇතුලත් කර ඇති බවට ගාල්ල පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත. සිද්ධියෙන් බරපතල තුවාල ලැබූ පිරිමි පුද්ගලයා රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 47 ක් වූ අයි.ඩී.එච්. වත්ත, දඩල්ල, ගාල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තුවාල ලැබූ වයස අවුරුදු 45 ක් වන මරණකරුගේ බිරිඳ සහ අවුරුදු 15 ක් වන දියණිය රෝහලේ ප්‍රතිකාර ලබයි. මෘත ශරීරය ගාල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා ගාල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බියගම පොලිස් ස්ථානය.**

2024.11.14 වන දින උදෑසන කාලයේ බියගම පොලිස් වසමේ කොට්ටුන්න මාර්ගයේදී බියගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 23 මිලිග්‍රෑම් 980 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වන බියගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බියගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. විදුලි සැර වැදී පුද්ගලයෙකු මියයාම - මැදවච්චිය පොලිස් වසම.

2024.11.14 වන දින උදෑසන කාලයේදී මැදවච්චිය පොලිස් වසමේ යකාවැව ප්‍රදේශයේදී විදුලි සැර වැදී පුද්ගලයෙකු මියගොස් ඇති බවට මැදවච්චිය පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 31 ක් වූ යකාවැව, මැදවච්චිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු විසින් තමාගේ ඉඩමේ ඇද තිබූ අනවසර විදුලි රැහැනක පැටලී මෙම මරණය සිදුව ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත. මෘත ශරීරය මැදවච්චිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මැදවච්චිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - තිස්සමහාරාමය පොලිස් වසම.

2024.11.14 වන දින දහවල් කාලයේ තිස්සමහාරාමය පොලිස් වසමේ තිස්සමහාරාමය කතරගම මාර්ගයේ කාවන්තිස්සපුර ප්‍රදේශයේදී තිස්සමහාරාමය දෙස සිට කතරගම දෙසට ධාවනය වූ කාර් රථයක් ඉදිරියෙන් පැමිණි ත්‍රිරෝද රථයක මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් ත්‍රිරෝද රථයේ රියදුරු හා පිටුපස ගමන්කළ ස්වාමීන් වහන්සේලා දෙනමක් බරපතල තුවාල ලබා කතරගම රෝහලට ඇතුලත් කිරීමෙන් පසු වැඩිදුර ප්‍රතිකාර සඳහා හම්බන්තොට රෝහලට මාරු කර යවා ප්‍රතිකාර ලබමින් සිටියදී එක් ස්වාමීන් වහන්සේ නමක් අපවත් වී ඇත.

**අපවත් වූ හිමි නම වයස අවුරුදු 84 ක් වූ කොමලිගම, තණමල්විල ප්‍රදේශයේ ආරණ්‍ය සේනාසනයක වැඩවාසය කරනු ලබයි.**

මෘත ශරීරය හම්බන්තොට රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් කාර් රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. තිස්සමහාරාමය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - ගලෙන්බිඳුණුවැව පොලිස් වසම.

2024.11.14 වන දින දහවල් කාලයේ ගලෙන්බිඳුණුවැව පොලිස් වසමේ ගලෙන්බිඳුණුවැව ගනේවල්පොල මාර්ගයේ යකල්ල තැපැල් කාර්යාලය අසලදී ගනේවල්පොල දෙස සිට ගලෙන්බිඳුණුවැව දෙසට ධාවනය වූ යතුරු පැදියක් පැදිකරුට පාලනය කර ගත නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන පෙරළීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරු පැදිකරු සහ පසු පැදිකරු බරපතල තුවාල ලබා යකල්ල රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා අනුරාධපුර රෝහලට මාරු කර යවා ප්‍රතිකාර ලබමින් සිටියදී පැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 17 ක් වූ නාවක්කුලම, මෙගොඩවැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය අනුරාධපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ගලෙන්බිඳුණුවැව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. මාරක රිය අනතුරක් - මහියංගණය පොලිස් වසම.

2024.11.14 වන දින උදෑසන කාලයේ මහියංගණය පොලිස් වසමේ මහියංගණය පරගම්මන මාර්ගයේ දඹගොල්ල ප්‍රදේශයේදී මැදඹය දෙස සිට පරගම්මන දෙසට ධාවනය වූ යතුරු පැදියක් පාපැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පාපැදිකරු, යතුරු පැදිකරු සහ පසු පැදිකරු බරපතල තුවාල ලබා මහියංගණය රෝහලට කිරීමේදී පාපැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 62 ක් වූ මාපාකඩවැව, මහියංගණය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මහියංගණය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මහියංගණය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - ආරච්චිකට්ටුව පොලිස් වසම.

2024.11.14 වන දින අළුයම් කාලයේ ආරච්චිකට්ටුව පොලිස් වසමේ හලාවත පුත්තලම මාර්ගයේ අඩිප්පලට හැරෙන හන්දියේදී පුත්තලම දෙස සිට හලාවත දෙසට ධාවනය වූ වෑන් රථයක් පදික පුද්ගලයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පදික පුද්ගලයා බරපතල තුවාල ලබා හලාවත රෝහලට කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 55 ක් වූ වෙලංකැලේ, අඩිප්පල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය හලාවත රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් වෑන් රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. ආරච්චිකට්ටුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**